# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර සේවා ගණය පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද | අනෙකුත් අනිවාර්ය අවශ්‍යතා | වැටුප් කේත අංකය හා අවශ්‍යතා | සටහන | වයස් සීමාව |
|---|---|---|---|---|---|
| **විකිරණ ශිල්පී (Radiographer)** තාක්ෂණ නොවන NT පුරප්පාඩු සංඛ්‍යාව 01 | අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම හා අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සමත්වීම.<br>සමග<br>රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක විකිරණ ශිල්පියෙකු වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද | විකිණිරණ ශිල්පියෙකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ලියාපදිංචි සහතිකය | 8:3 (NT3) මූලික වැටුප් පියවර : රු. 44,295/=<br>වාර්ෂික වේතනාධිකය : රු. 795/=<br>(දළ වැටුප මාසිකව රු. 119,000 ක් පමණ වේ) | සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ ව්‍යුහගතක, ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. | අවුරුදු 18 – 45 අතර විය යුතුය. රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත. මෙම තනතුර සඳහා අයදුම්කරන සේවා මුක්ත භටයින්ට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 299 හා 1985.07.23 දින දරන චක්‍රලේඛ ප්‍රතිපාදන අදාළ වනු ඇත. |
| **ඖෂධවේදී (Pharmacist)** තාක්ෂණ නොවන NT පුරප්පාඩු සංඛ්‍යාව 01 | අ.පො.ස (උ.පෙළ) විභාගය එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම හා අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සමත්වීම.<br>සමග<br>රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ඖෂධවේදියකු වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද | ඖෂධවේදියකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ලියාපදිංචි සහතිකය | 8:3 (NT3) මූලික වැටුප් පියවර : රු. 44,295/=<br>වාර්ෂික වේතනාධිකය : රු. 795/=<br>(දළ වැටුප මාසිකව රු. 119,000 ක් පමණ වේ) | සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ ව්‍යුහගතක, ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. | අවුරුදු 18 – 45 අතර විය යුතුය. රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත. මෙම තනතුර සඳහා අයදුම්කරන සේවා මුක්ත භටයින්ට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 299 හා 1985.07.23 දින දරන චක්‍රලේඛ ප්‍රතිපාදන අදාළ වනු ඇත. |
| **හෙද නිලධාරී (පිරිමි/ කාන්තා) (Nurse Male/ Famale)** තාක්ෂණ නොවන NT පුරප්පාඩු සංඛ්‍යාව 03 | අ.පො.ස (උ.පෙළ) විභාගය ජීව විද්‍යා හෝ භෞතික විද්‍යා විෂයය ධාරාව යටතේ එකවර විෂයයන් තුන (03) කින් සමත්වීම හා අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සමත්වීම.<br>සමග<br>රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක හෙද නිලධරයකු වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද. | හෙද නිලධාරයකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) හෝ පුද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ (PHSRC) හෝ ජාතික හෙද සභාවේ (SLNC) ලියාපදිංචි සහතිකය | 8:3 (NT3) මූලික වැටුප් පියවර : රු. 44,295/=<br>වාර්ෂික වේතනාධිකය : රු. 795/=<br>(දළ වැටුප මාසිකව රු. 119,000 ක් පමණ වේ) | සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ ව්‍යුහගතක, ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. | අවුරුදු 18 – 45 අතර විය යුතුය. රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත. මෙම තනතුර සඳහා අයදුම්කරන සේවා මුක්ත භටයින්ට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 299 හා 1985.07.23 දින දරන චක්‍රලේඛ ප්‍රතිපාදන අදාළ වනු ඇත. |

**වෙනත්**

**සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

iv. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණ අනුව හෝ තනතුරට අදාල වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.

v. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.

vi. රජයේ හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුර සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාල දෙපාර්තමේන්තු /සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

සම්පූර්ණ ජීව දත්ත ඇතුළත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික , සේවා සහතිකවල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව සකස් කළ අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2026.06.05 දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වග කියනු නොලැබේ. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)**
**මානව සම්පත් හා පරිපාලන කොට්ඨාසය,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ - 13.**